සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

01 ආධ්‍යාත්මික කොටස අතරින් 'වරඋ' යන පදයෙහි තේරුම වන්නේ,
(1) ඇල්ම නොමැති ජීවිතය (2) දේවාදරය
(3) දේව භක්තිය (4) දේව බිය

02 සහාබාවරු හබසාවට හිජ්රත් ගිය නුබුව්වත් වර්ෂය
(1) නුබුව්වත් 5 (2) නුබුව්වත් 3 (3) නුබුව්වත් 8 (4) නුබුව්වත් 10

03 මූලික ඉස්ලාමීය නීති මූලයන් තුළ අඩංගු වන්නේ,
(1) ඉජ්මා (2) කියාස් (3) ඉස්තිහ්සාන් (4) සුන්නා

04 නබි (සල්) තුමා හා සහාබාවරු ජීවත් වූ ආකාරය
(1) තපස් ජීවිතය (2) සුගිත්වය
(3) ලෝකාශාව (4) අහ්ලුස් සුන්නාවල් ජමා අත්

05 තෘප්තිමත් මනස හැඳින්වෙන්නේ,
(1) නෆ්සුල් ලව්වාමා (2) නෆ්සුල් මුත්මඉන්නා (3) නෆ්සුල් අම්මාරා (4) නෆ්සුල් හවා

06 කලා කද්ර් පිළිබඳ කියවන අකීදාවෙහි කොටස
(1) අස්සම්ඉයියාත් (2) අන්නුබුව්වාත් (3) අල් ඉලාහියියාත් (4) අර්රූහානියියාත්

07 රසූල්වරුන්ට අනිවාර්යයෙන් තිබිය යුතු ගුණාංග
(1) 2 (2) 4 (3) 5 (4) 20

08 ගමනකදී සලාතය
(1) නැමදීමෙන් වැළකී සිටිය හැක. (2) එකතුකර පමණක් ඉටුකළ හැකිය.
(3) කෙටිකර පමණක් ඉටුකළ හැකිය. (4) එකතුකර හා කෙටිකර ඉටුකළ හැකිය.

09 රමලාන් මාසයේ පමණක් ඉටුකළ හැකි සලාතය
(1) විත්ර් (2) තරාවීහ් (3) කියාමුල් ලෛල් (4) ලුහා

10 'අස්තෘෆිරුල්ලාහ්' වෙහි තේරුම
(1) අල්ලාහ් තආලා අති ශුද්ධවන්තයෙකි. (2) සියලු ප්‍රශංසා අල්ලාහ් තආලාට ය.
(3) අල්ලාහ්ගෙන් සමාව අයදිමි. (4) අල්ලාහ් තආලා අති ශ්‍රේෂ්ඨ වේ.

11 අර්කානුල් කියාසෙහි ඇතුලත් නොකළ දේ
(1) අල් අමල් (2) අල් අස්ල් (3) අල් ඉල්ලත් (4) අල් පර්උ

12 හුලුක් හසන් යනු
(1) නරක ගුණාංග (2) පහත් ගුණාංග (3) යහපත් ගුණාංග (4) නරක හැසිරීම

13 නබි (සල්) තුමාගේ ආරක්ෂාව පිණිස වැඩි අවදානම් යොමු කළේ,

(1) අබූජහ්ල් (2) අබූ සුෆ්යාන් (3) අබූ තාලිබ් (4) උත්බාබින් ආමිර්

14 අරාබි රටේ උතුරු ප්‍රදේශයේ මායිම වන්නේ,

(1) සිරියා කාන්තාරය (2) රතු මුහුද (3) අරාබි මුහුද (4) පර්සියන් බොක්ක

15 අල් කුර්ආනය විටින් විට අවුරුදු කීයකින් පහළ වුනේ ද?

(1) අවුරුදු 13 (2) අවුරුදු 23 (3) අවුරුදු 33 (4) අවුරුදු 43

16 ''රබ්බුල් ආලමීන්'' යෙහි තේරුම

(1) මිනිසුන්ගේ රබ්

(2) සකල ලෝකයේ දායාදය

(3) සකල ලෝකයම මවා පාලනය කරන්නා වූ අල්ලාහ්

(4) සමාජයේ රබ්

17 නබි ඉබ්‍රාහිම් (අලෛ) තුමාගේ විරුද්ධවාදියා වූ රජතුමා

(1) ෆිර් අවින් (2) අබ්‍රහා (3) හාමාන් (4) නම්රූද්

18 උලුල් අස්මි ලෙස හඳුන්වන නබිවරයෙක්

(1) ආදම් (අලෛ) (2) සාලිහ් (අලෛ) (3) මූසා (අලෛ) (4) සුඅයිබ් (අලෛ)

19 වස්තුවලින් ඉටුකරන අනිවාර්ය නැමදුමක් වන්නේ,

(1) සලාත් (2) අස්සව්ම් (3) ෂහාදත් (4) සකාත්

20 සජදා සහ්වු යනු

(1) අමතකවීම සඳහා වූ සජදාව (2) කළගුණ සැලකීමට කරන සජුදා

(3) අල්කුර්ආනයේ පාරායාණය සඳහා වූ සජදා (4) සලාතයේ ඉටුකරන සජදා

21 උහද් යුද්ධය ඇතිවූ හිජ්රි අවුරුද්ද

(1) 1 (2) 2 (3) 3 (4) 4

22 පහත සඳහන් අයගෙන් නොමඟ ගිය අකීදා වර්ග නොමැත්තේ,

(1) ජබරියා (2) මුඃතසිලා (3) අශ්කරියියා (4) මුර්ජියියා

23 අල්කුර්ආනය එක්රැස් කිරීමට පත්කළ සහාබාවරයා

(1) උස්මාන් (රළි) (2) සෙයිද් ඉබ්නු සාබිත් (රළි)

(3) උමර් (රළි) (4) සෙයිද් (රළි)

24 X කොටසෙහි ඇති වචනවලට ගැළපෙන වචනය Y කොටසෙන් තෝරා ගත්විට ලැබෙන නිවැරදි පිළිතුර

| X | Y |
|---|---|
| i. බද්ර් | A හිජ්රි - 6 |
| ii. උහද් | B හිජ්රි - 8 |
| iii. හුදෙයිබියා | C හිජ්රි - 3 |
| iv. මක්කා ජයග්‍රහණය | D හිජ්රි 2 |

(1) DCAB (2) DCBA (3) DACB (4) DBCA

25 තයම්මුම් කිරීම සඳහා භාවිතයට ගන්නේ,

(1) පිරිසිදු ජලය (2) මැටි (3) මඩ (4) දූවිලි සහිත පස්

26 මාඋන් නජීසයට උදාහරණයක් වන්නේ,

(1) තැඹිලි වතුර (2) තේ වතුර (3) ජරා වතුර (4) වැව් වතුර

27 අල්කුර්ආනය පාරායනා කරන පිළිවෙළ

(1) කර්තීබුන් නුසුල් (2) තර්තීබුත් තිලාවත් (3) තර්තීබුල් කිරාඅත් (4) තර්තීබුල් උසුල්

28 ප්‍රථම වරට අල්කුර්ආනය පහළ කරන ලද මාසය

(1) රමළාන් (2) දුල්හජ් (3) මුහර්රම් (4) සෘබාන්

29 දෙවන අකබා ගිවිසුම සිද්ධ වූ හිජ්රි වර්ෂය

(1) නුබුව්වත් 10 (2) නුබුව්වත් 11 (3) නුබුව්වත් 12 (4) නුබුව්වත් 13

30 ''නුඹලාගෙන් කෙනෙක් අන් අයගේ වස්තූන් වැරදි ආකාරයට නොකනු'' යනුවෙන් අර්ථය දෙන වාක්‍ය වන්නේ,

(1) අල්කුර්ආන් වාක්‍යයකි. (2) නබි (සල්) තුමාගේ වැකියකි.

(3) අබුබක්කර් (රලි) තුමාගේ වැකියකි. (4) ඉමාම්වරයෙකුගේ වැකියකි.

31 ජින්වරුන් කුමකින් මවන ලද්දේ ද?

(1) ගින්දරින් (2) පස්වලින් (3) සුළඟින් (4) එළියෙන්

32 මහ කිළිට ඇතිකරන ක්‍රියාවන් කීයක් තිබේ ද?

(1) 3 (2) 4 (3) 2 (4) 5

33 ජාහිලියා කාල මිනිසුන් ළඟ තිබූ හොඳ ගතිගුණ නොවන්නේ,

(1) සංග්‍රහා පැවැත්වීම (2) පොරොන්දු ඉෂ්ඨ කිරීම

(3) වීරත්වය (4) පළිගැනීම

34 නබි (සල්) තුමාගේ ජීවිත කතාව ප්‍රථමවරට ලීවේ

(1) ඉමාම් අත්තබරි (2) මුහම්මද් බින් ඉස්හාක්

(3) ඉබ්නු සහිරයාර් (4) ඉමාම් බලාදූරි

35 නබි (සල්) තුමාණන්ගේ සමාජයට අල්ලාහ්තආලාගේ බරකත් කරන වේලාවක් ලෙස හදීසයේ සඳහන් වන්නේ,

(1) දවල් කාලය (2) සවස් කාලය (3) මධ්‍යම රාත්‍රිය (4) උදෑසන

36 ඇල්ම නොමැති ජීවිතය හඳුන්වන පදය

(1) වරඋ (2) මහව්වත් (3) සුහ්ද් (4) තවක්කුල්

37 ආත්මික උසස්වීමට හේතු නොවන්නේ,

(1) තව්බා (2) තක්වා (3) කිත්බ් (4) සුහ්ද්

38 භූමිය අලංකාර කිරිමේ ක්‍රියාව හඳුන්වන්නේ,

(1) කිලාපත් (2) ඉබාදත් (3) වලාදත් (4) ඉමාරත්

39 නබිතුමා සලාතයට පසු පාරයනා කළ සූරතයක් වන්නේ,

(1) සූරා ෆලක් (2) සූරා ෆාතිහා (3) සූරා යාසීන් (4) සූරා රහ්මාන්

40 සලාතුල් කව්ෆ් යනු කුමක් ද?

(1) ඊද් සලාතය (2) භීති සලාතය

(3) ග්‍රහණ සලාතය (4) වර්ෂාව අයැදීමේ සලාතය

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.
- (i) ''වහී'' යෙහි කොටස් දෙක ලියන්න.
- (ii) ඉජ්මාවෙහි කොටස් දෙක ලියන්න.
- (iii) ''සීරා'' යනු කුමක් ද?
- (iv) අත්තහීයියාත් වෙනුවෙන් තිබෙන හිඳුම් දෙක කුමක් ද?
- (v) ජමාඅත් ලෙස ඉටුකරන සුන්නත් සලාතයන් දෙකක් ලියන්න.
- (vi) අකීදාවෙහි කොටස් හතර ලියන්න.
- (vii) පිරිසිදු ගැන කියවෙන හදීසයක් ලියන්න.
- (viii) මාඋන් තාහිර්වලට උදාහරණ දෙකක් ලියන්න.
- (ix) දේව භක්තිය ඇත්තන්ගේ ගතිගුණ ගැන කියවෙන සූරාව කුමක් ද?
- (x) කයීන නජීසයට උදාහරණ දෙකක් ලියන්න. (2 x 10 = 20)

(02)
- (i) රිසාලත්, හිදායත් යන පද පැහැදිලි කරන්න.
- (ii) පිරිසිදු අකීදාව ආරක්ෂා කිරීමට උත්සාහ දැරූ ඉමාම්වරුන් තුන්දෙනෙකුගේ නම් ලියන්න.
- (iii) අපි දිනපතා කරන ක්‍රියාවන් ඉබාදත් ලෙස මාරුවීමට ඇති කොන්දේසි 5 ක් ලියන්න. (ලකුණු 10)

(03)
- (i) තස්කියා යනු කුමක් ද?
- (ii) සජදාවන් තුළින් සජදාවන් තුනක නම් ලියන්න.
- (iii) සලාතය මගින් ලෞකික ප්‍රයෝජන 5 ක් ලියන්න. (ලකුණු 10)

(04)
- (i) මදීනා නගරයේ පැරණි නම කුමක් ද?
- (ii) ජාහිලියකාල මිනිසුන් ළඟ තිබූ හොඳ ගතිගුණ 3 ක් ලියන්න.
- (iii) නීති මූලයන් 5 ක් ලියන්න. (ලකුණු 10)

(05)
- (i) කුත්තාබුල් වහී යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?
- (ii) කියාසයෙහි රුකන් 3 ක් ලියන්න.
- (iii) තව්බා කිරීමට ඇති කොන්දේසි 4 ක් ලියන්න. (ලකුණු 10)

(06)
- (i) වහි යනු කුමක් ද?
- (ii) නබී (සල්) තුමාණන්ට වහී පහළ වූ ක්‍රම තුනක් ලියන්න.
- (iii) වහීයෙහි වැදගත්කම් 5 ක් ලියන්න. (ලකුණු 10)

(07)
- (i) නබි (සල්) තුමාණන්ගේ ජීවිත කතාව ගැන ප්‍රථමවරට එළිදැක් වූ පොත කුමක් ද?
- (ii) නබි (සල්) තුමාගේ සීරාව ආරක්ෂා කිරීමට හේතූන් 3 ක් ලියන්න.
- (iii) ඉස්ලාමීය ආර්ථිකත්වයේ මූලික කරුණු 5 ක් දක්වන්න. (ලකුණු 10)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2018**

**10 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(4) | 5 -(2) | 6 -(3) | 7 -(2) | 8 -(4) | 9 -(2) | 10 -(3) |
| 11-(1) | 12 -(3) | 13 -(3) | 14 -(1) | 15 -(2) | 16 -(3) | 17 -(4) | 18 -(3) | 19 -(4) | 20 -(1) |
| 21-(3) | 22 -(3) | 23 -(2) | 24 -(1) | 25 -(4) | 26 -(3) | 27 -(2) | 28 -(1) | 29 -(3) | 30 -(1) |
| 31-(1) | 32 -(3) | 33 -(4) | 34 -(2) | 35 -(4) | 36 -(3) | 37 -(3) | 38 -(4) | 39 -(1) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) (i) වහි මත්ලුවු, වහි ගෛරු මත්ලුවු

(ii) ඉජ්මා සරීහ්, ඉජ්මා සුකූති, ඉජ්මා අක්සරියා

(iii) නබි (සල්) තුමාගේ ජීවිත කතාව

(iv) ඉෆ්තිරාශ්, තවර්රුක්

(v) ග්‍රහණය සලාතය, වැස්ස ලබාගැනීම සඳහා වූ සලාතය, ඊද් සලාතය

(vi) අල් ඉලාහියියාත්, අර්රුහානියියාත්, අස්සම් ඉයියාත්, අන්නුබුව්වාත්

(vii) පිරිසිදුකම විශ්වාසයේ අර්ධයක් වන්නේ ය.

(viii) තේ, සෝඩා වතුර, තැඹිලි යානාදී

(ix) සූරා ෆුර්කාන්

(x) බල්ලන්, ඌරන්ගේ මළ මුත්‍රා, කෙළ, සොටු, ලේ ආදිය (2 x 10 = 20)

(02) (i) රිසාලත් - දූතභාවය / හිදායත් - යහමඟ

(ii) ඉමාම් අහමදු බින් හන්බල්, ඉමාම් මන්සූර් අල් මාතුරුදි, ඉමාම් අබුල් හසන් අල් අශ්කරි, ඉමාම් තහාවි

(iii) පිරිසිදු චින්තන, ඉස්ලාමයේ අනුමැතිය, නීති රීතිවලට බාධා නොවීම, මූලික නැමදුම්වලට බාධා නොවීම, පිළිවෙළ යනාදී (ලකුණු 10)

(03) ලියා ඇති නිවැරදි පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ලකුණු 10)

(04) (i) යස්රිබ්

(ii) පොරොන්දු කඩනොකිරීම / සංග්‍රහයන් පැවැත්වීම / වීරත්වය යනාදී

(iii) සාමය, සමගිය, සහෝදරත්වය, නායකත්වයට අවනත වීම, පිරිසිදුභාවය, කාලවේලා කළමනාකරණය, ශාරීරික අභ්‍යාස යනාදී (ලකුණු 10)

(05) (i) වහි දේව වැකි ලිවීමේ යෙදී සිටියන්

(ii) අල් අසල්, අල් ෆරුළ, අල් ඉල්ලත්, අල් හුකුම්

(iii) පිරිසිදු චින්තන, කරපු පවෙන් මිදීම, කරපු පවට දුක්වීම

(iv) මිනිසුන් සමග කරපු පවක් නම් ඔවුන්ගෙන් සමාව ලබාගැනීම.

(06) (i) දූතභාවය

(ii) ජිබ්රීල් (අලෛ) විසින් / හීනයෙන් / මනසෙහි මතුවීම

(iii) යහමඟ ලැබීමට වහි අවශ්‍යයි / මිනිසුන්ට හොඳ නරක පැහැදිලි කිරීමට / මිනිසුන්ට ස්වර්ගය, නිරය ගැන පැහැදිලි කිරීමට / අල්ලාහ්ගේ දඬුවම් ගැන අවවාද කිරීමට

(07) (i) සීරත් රසූලුල්ලාහ්

(ii) සබි (සල්) තුමා අවසාන නබිවරයෙක් නිසා / නබි (සල්) තුමාගේ සීරාව මිනිසාට අවශ්‍ය නිසා / නබි (සල්) තුමාගේ ලස්සන ගුණාංග තිබූ නිසා / නබි (සල්) තුමා එකල ලෝකයටම දායාදයක් වූ නිසා

(iii) සම්පත් සියල්ල අල්ලාහ් තආලාමය / අවසාන විනිශ්චය දිනයේ ධනය පිළිබඳ ප්‍රශ්න කරනු ලැබේ / ධනය මිනිසාට පරීක්ෂණයකි. / තනි මිනිසාගේ ධනයේ සමාජයට අයිතියක් ඇත. / පොලිය වළක්වයි / රැවටීම, ආහාර ද්‍රව්‍ය සඟවා තැබීම වැනි ක්‍රියාවලින් වැළකීම.